# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2473/16 - 2026 ජනවාරි මස 28 වැනි බදාදා - 2026.01.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.සීඑෆ්. 1/64**

**මහජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2026 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

ලුහුඬු නාමය

**1.** මේ නියෝග 2026 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක*

## I වන කොටස

### සාමාන්‍ය

අර්ථ නිරූපණය

**2.** (1) මේ නියෝගවල වෙනත් යම් අර්ථ නිරූපණයක් ප්‍රකාශිතව ම එහි සඳහන් කර ඇත්නම් මිස හෝ එය එහි අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම සඳහන් කර ඇත්නම් මිස හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

"නිසි බලධරයා" යන්නෙන්, මේ නියෝගවල කාර්යය සඳහා නිසි බලධරයකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ;

"අත්‍යවශ්‍ය සේවාව" යන්නෙන්, මහජන උපයෝගීතාවයෙන් යුතු වන්නා වූ හෝ මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ ජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය වූ යම් සේවාවක් අදහස් වන අතර, ඊට යම් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ද ඇතුළත් වේ;

"ඉඩම" යන්නට, ජලයෙන් වැසුනු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදාවක සාමාජිකයකු අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"අධිග්‍රහණය කර ගැනීම" යන්න, යම් වාහනයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ වාහනයේ සන්තකය ලබා ගැනීම හෝ අධිග්‍රහණයට ගැනීමේ බලධරයාට කැමැත්තක් කිරීම සඳහා ඒ වාහනය ඔහුට භාරදෙන ලෙස නියම කිරීම අදහස් වේ. තව ද, එහි ව්‍යාකරණ ප්‍රභේද හෝ සජාතීය පාඨ ඒ අනුව තේරුම් ගත යුතු ය;

"ආරක්ෂක විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන්නට, ආරක්ෂක අමාත්‍යාංශයේ යම් අතිරේක ලේකම්වරයෙක් ද ඇතුළත් වේ;

"ශ්‍රී ලංකාව" යන්නෙන්, ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය අදහස් වන අතර ඊට දේශීය ජලතීරය සහ ගුවන් අවකාශය ද ඇතුළත් වේ ;

"දේශීය ජලතීරය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(2) (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනත, යම් පනතක හෝ ආඥාපනතක හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක හෝ අර්ථ නිරූපණය සඳහා අදාළ වන පරිද්දෙන් ම, මේ නියෝග සහ ඒ යටතේ සාදන ලද යම් නියම හෝ රීති අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) මේ නියෝගවල විධිවිධාන යටතේ කරනු ලැබූ විධානයක හෝ සාදනු ලැබූ නියමයක කාලසීමාවක් නිශ්චිතව දැක්විය යුතු යයි මේ නියෝග යටතේ නියම කර ඇත්තා වූ ද, *නැතහොත්* එසේ නිශ්චිතව දැක්වීමට එම නියෝගයෙන් ඉඩ සලස්වා ඇත්තා වූ ද එවැනි යම් කාලසීමාවක් එම විධානයෙන් හෝ නියමයෙන් නිශ්චිතව දක්වා නොමැත්තා වූ ද අවස්ථාවක, එම කාලසීමාව, එම විධානය හෝ නියමය කරනු ලැබූවේ හෝ සාදනු ලැබුවේ යම් විධිවිධානයක් යටතේ ද එම නියෝගය බලාත්මකව පවතින කාලසීමාව වශයෙන් සැලකිය යුතු ය.

හදිසි අවස්ථා බලතල ජනාධිපතිවරයාගේ අනෙකුත් බලතලවලට අමතරව විය යුතු බව

**3.** අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ නියෝග මගින් පිරිනමන ලද බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් යම් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීතිය මගින් සතු කරන

ලද හෝ පිරිනමන ලද වෙනත් යම් අයිතිවාසිකම් හෝ බලතලවලට අමතරව විය යුතු අතර එම අයිතිවාසිකම් හෝ බලතල හීන කිරීමක් නොවිය යුතු ය.

ජනාධිපතිවරයාගේ බලතල යම් අමාත්‍යවරයකු වෙත පැවරීම

**4.** මේ නියෝග මගින් ජනාධිපතිවරයා වෙත පිරිනමනු ලැබූ හෝ පවරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම් අමාත්‍යවරයකු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

නිසි බලධරයා පත් කිරීම

**5.** (1) ජනාධිපතිවරයා විසින්, මේ නියෝගවල කාර්ය සඳහා යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් නිසි බලධරයා වශයෙන්, සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ තැනැත්තා පත්කරනු ලබන ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා පත්කරනු ලැබිය හැකි අතර, ඒ පත් කිරීම ඒ ලියවිල්ලෙහි නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් නියෝගයක කාර්ය සඳහා හෝ යම් නිශ්චිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා නිසි බලධරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත්කිරීම මේ ඡේදයේ මතු සඳහන් විධිවිධාන කිසිවකින් වළකනු ලැබ ඇතැයි නොසැලකිය යුතු ය.

(2) යම් නම් කළ ධුරයක් දරන්නකු නිසි බලධරයකු ලෙස පත්කරනු ලැබ ඇති අවස්ථාවක, පටහැනි විධිවිධානයක් ප්‍රකාශිතව කර ඇත්නම් මිස, එවකට එකී නම් කළ ධුරයෙහි කාර්යය ඉටු කරන තැනැත්තා වෙත ඒ පත්කිරීම දීර්ඝ වන ලෙස සැලකිය යුතු ය.

දැන්වීම් භාරදීම

**6.** මේ නියෝගවල කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාර දිය යුතු දැන්වීමක්, මේ නියෝගවල අඩංගු යම් විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒ තැනැත්තාට භාරදීම හෝ ඒ තැනැත්තාගේ අවසානයට දැන සිටි හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත තැපෑලෙන් යැවීමෙන් භාර දිය හැකි ය.

නියමයන් ආදිය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හා වෙනස් කිරීම

**7.** යම් නියමයක් හෝ රීතියක් සෑදීම සඳහා මේ නියෝග මගින් පිරිනමන ලද යම් බලයකට, ඒ නියමය හෝ රීතිය සමාන ආකාරයෙන් සහ සමාන කොන්දේසිවලට යටත්ව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ වෙනස් කිරීම සඳහා වන බලය ද ඇතුළත්වන ලෙස තේරුම් ගත යුතු ය.

## II වන කොටස

### පරිශ්‍ර සන්තකයට ගැනීම සහ වාහන සහ පුද්ගල සේවාවන් අයිගුහණයට ගැනීම

පරිශ්‍ර අයිගුහණයට ගැනීම

**8.** පුද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක් හෝ වෙළඳ ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක් හැර යම් ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක් යම් ස්වභාවික විපතක් සම්බන්ධයෙන් වන සහන කටයුතු සඳහා අවශ්‍යවන අවස්ථාවක, එම ප්‍රදේශයේ පොලිස් අධිකාරිවරයා විසින් එකී කාර්යය සඳහා එම ගොඩනැගිලි හෝ පරිශ්‍රයේ සන්තකය ලබාගත යුතු අතර එහි සිටින යම් තැනැත්තකු එම ගොඩනැගිල්ලෙන් හෝ පරිශ්‍රයෙන් පිටමං කොට යම් බලරහිත තැනැත්තන් එම ගොඩනැගිලි හෝ පරිශ්‍රවලට ප්‍රවේශවීමෙන් ආරක්ෂා කළ යුතු ය.

වාහන අයිගුහණය කිරීම

**9.** (1) මහජන සාමය සුරක්ෂිත කිරීම සඳහා හෝ ජන ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි හෝ එසේ කිරීම සුදුසු යයි නිසි බලධරයාගේ මතය වන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ඇති පුද්ගලික අයිතියක් දරන වාහන හැර යම් වාහනයක් ඔහු විසින් අයිගුහණය කරනු ලැබිය හැකි අතර එම අයිගුහණය සම්බන්ධව අවශ්‍ය යයි හෝ සුදුසු යයි නිසි බලධරයාට පෙනී යන විධාන ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ යම් වාහනයක් නිසි බලධරයා විසින් අයිගුහණය කරනු ලැබූ අවස්ථාවක, මහජන සාමය සුරක්ෂිත කිරීම හෝ ජන ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම පිණිස සුදුසු යයි නිසි බලධරයා අදහස් කරන යම් කාර්යයක් සඳහා සහ යම් ආකාරයකට ඒ වාහනය භාවිත කිරීම හෝ ඒ වාහනය සම්බන්ධයෙන් කටයුතු කිරීම, හෝ භාවිත කිරීම හෝ කටයුතු කිරීම සඳහා බලය දීම කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදයෙන් පිරිනමන ලද බලතල සාර්ථකව ක්‍රියාවේ යෙදීම පිණිස නියමයක් කිරීම අවශ්‍ය බව නිසි බලධරයකුගේ මතය වන්නේ නම්, ඔහු විසින් මුළු ශ්‍රී ලංකාව හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත කොටසකට අදාළව කරනු ලබන නියමයක් මගින්, ඒ නියමය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ඒ නියමයේ විස්තර කර තිබිය හැකි යම් වාහනයක් ඒ නියමය අදාළ ප්‍රාදේශයේ යම් පරිශ්‍රයක, තමා සන්තකයේ *නැතහොත්* තමාගේ පාලනය යටතේ තිබෙන කිසිම තැනැත්තකු විසින් ඒ වාහනය එම පරිශ්‍රයෙන් ඉවත්කර ගැනීමට එකී නියමයේ නිශ්චිතව සඳහන්ව ඇති තැනැත්තකු විසින් හෝ බලධරයකු විසින් අවසර දෙන තෙක් ඒ පරිශ්‍රයෙන් ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම හෝ අවසර දීම නොකළ යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගයේ මතු සඳහන් විධිවිධාන මගින් යම් තැනැත්තකු වෙත පිරිනමන ලද බලතල ක්‍රියාවේ යෙදවීමෙහි ලා උපකාර කරන ලෙස සහ සහාය වන ලෙස ඒ තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, සන්නද්ධ සේවයක හෝ ආණ්ඩුවේ යම් නිලධරයකු විසින් එසේ උපකාර කිරීම හෝ සහාය වීම කළ යුතු ය.

පුද්ගල සේවා අධිග්‍රහණය කිරීම

**10.** අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා උපකාර වශයෙන් හෝ ඒ හා සම්බන්ධයෙන් යම් කාර්යයක් කිරීමට හෝ පුද්ගලික සේවයක් කිරීමට, ස්වකීය අත්සන යටතේ නියමයකින් යම් රජයේ නිලධරයකුට නියම කිරීම හෝ ඒ ආකාරයෙන් නියම කිරීමට ඒ වෙනුවෙන් බලධරයන් හෝ නිලධරයන් එක් තැනැත්තකුට හෝ ඊට වැඩි දෙනෙකුට බලය පැවරීම ජනාධිපතිවරයා විසින් කළ හැකි ය. මේ නියෝග යටතේ සාදන ලද යම් නියමයක් කඩ කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් රජයේ නිලධරයකු වරදක් සිදු කරන්නේ ය.

අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත්කිරීම

**11.** (1) ජනාධිපතිවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහා ම හෝ ඉන් කොටසක් සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි ය. අත්‍යවශ්‍ය සේවා සැපයීම සහ පවත්වාගෙන යාමට අදාළ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි නියෝජ්‍ය කොමසාරිස්වරුන් හෝ සහකාර කොමසාරිස්වරුන් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(3) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ ඔහු වෙත පිරිනමා ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යක් (2) වන ඡේදය යටතේ පත්කරනු ලබන යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝග යටතේ වූ කාර්යය ඉටු කිරීමේ අරමුණින්, මේ නියෝගය යටතේ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත පිරිනමනු ලැබූ යම් බලතලයක්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය.

(5) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) මේ නියෝග යටතේ පත්කරන ලද යම් නිසි බලධරයකු; සහ
(ආ) මේ නියෝග යටතේ බලය පවරන ලද යම් නිලධරයකු හෝ සම්බන්ධීකරණ නිලධරයකු,

වෙත, අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යන බවට සහතික කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධාන ලබා දෙනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයකට ම අනුකූලව කටයුතු කිරීම, අවස්ථාවෝචිත පරිදි, එකී නිසි බලධරයාගේ, නිලධරයාගේ හෝ සම්බන්ධීකරණ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

අත්‍යවශ්‍ය සේවා

**12.** (1) මහජන සාමය පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සඳහා සහ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, ජනාධිපතිවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදයට අනුකූලව ජනාධිපතිවරයා විසින් අත්‍යාවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත් කරන ලද සේවයක් හා සම්බන්ධ යම් වැඩක යෙදී සිටින හෝ නියුක්ත කරනු ලැබ සිටින යම් තැනැත්තකු විසින් -

(අ) ඒ නියමයේ දින සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු ඔහුගේ වැඩ කරන හෝ සේවානියුක්ත ස්ථානයට හෝ ඔහුගේ සේවායෝජකයා හෝ ඔහුගේ සේවායෝජකයාගේ අධිකාරය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කලට නම් කරනු ලබන වෙනත් ස්ථානයකට පැමිණ සිටීම නීත්‍යානුකූල අවසරයක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ, ඒ සේවයේ ඔහුගේ සේවානියුක්ති නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව නියම කර ඇති පරිදි වැඩ කිරීම නීත්‍යානුකූල අවසරයක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ සාමාන්‍ය වැඩ කරන දිනයක සම්පූර්ණ වැඩ කරන කාලසීමාව තුළ හෝ ඉන් යම් කොටසක් තුළ වැඩ නොකර එසේ වැඩ කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ වැඩ කිරීමෙන් බැහැරව සිටියහොත්;

(ආ) ඒ නියමයේ දින සිට එක් දිනක් ඉකුත් වීමෙන් පසුව ඔහුගේ සේවායෝජක විසින් හෝ ඔහුගේ සේවායෝජකගේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි යම් වැඩක් කිරීම, නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්;

(ඇ) අත්‍යාවශ්‍ය සේවයක යොදවනු ලැබූ හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකුව සිටියදී ඔහුගේ සේවායෝජක හෝ ඔහුගේ සේවායෝජකගේ අධිකාරය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කලට විධාන කරනු ලැබිය හැකි පරිදි ඒ වැඩ, ඒ සේවායෝජක හෝ ඔහුගේ අධිකාරය යටතේ ක්‍රියාකරන තැනැත්තා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි වූ කාලසීමා ඇතුළත වූ වේලාවක දී හෝ ස්ථානයක දී ( ඒ වේලාව හෝ ස්ථානය හෝ කාලසීමාව සාමාන්‍ය වැඩ කරන වේලාව ඇතුළත හෝ ඉන් බාහිරව වුව ද නිවාඩු දිනවලදී වුවද ) ඉටු කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ඔහු එසේ පැමිණ සිටීම හෝ වැඩ කිරීම පැහැර හැර ඇත්තේ හෝ ප්‍රතික්ෂේප කර ඇත්තේ වැඩ වර්ජනයක් හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාමාර්ගයක් නිසා වුව ද එය නොතකා ඒ තැනැත්තා -

(i) වෙනත් යම් නීතියක හෝ ඔහුගේ සේවානියුක්තිය පාලනය වන යම් ගිවිසුමක නියම හා කොන්දේසිවල පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද වහාම ඔහුගේ සේවානියුක්තිය අවසන් කළ ලෙස හෝ අත්හැරිය ලෙස සියලු කාර්යය සඳහා සැළකිය යුතු ය; තව ද

(ii) ඊට අමතරව, ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(3) යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් බවට ජනාධිපතිවරයා විසින් *ගැසට්* පත්‍රයේ පළ කරන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක -

(අ) කවර වූ හෝ ආකාරයකින් -

(i) ඒ සේවය පවත්වාගෙන යාමට අවහිර කරන, බාධා කරන, ප්‍රමාද කරන හෝ සීමා කරන;

(ii) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකු ඔහුගේ සේවා ස්ථානයට පැමිණීම වළකමින් අවහිර කරන, බාධා කරන හෝ පැමිණීම වළක්වන;

(iii) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකු ඔහුගේ සේවා ස්ථානයට පැමිණීමෙන් වැළකීමට පොළඹවන, කැමති කරවා ගන්නා, හෝ ධෛර්යය දෙන;

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින් හෝ එහි ශාඛාවකින් වන සේවය වෙනුවට හෝ ඊට සමාන්තරව වෙනත් යම් සේවයක් පිහිටුවීමට හෝ පවත්වාගෙන යාමට බල කරන, පොළඹවන, කැමති කරවා ගන්නා හෝ ධෛර්යය දෙන;

(v) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකුට ඔහුගේ සේවා නියුක්තිය අත්හැරීමට හෝ ඒ සේවා නියුක්තියෙන් ඉවත්ව යාමට බල කරන, පොළඹවන, කැමැති කරවා ගන්නා හෝ ධෛර්යය දෙන ( ඒ වෙනත් තැනැත්තා ඒ හේතුවෙන් එසේ සේවානියුක්තිය අත්හැරීම හෝ ඉන් ඉවත්ව යාම කරනු ලැබුව ද නොලැබුව ද);

(vi) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව වෙනත් යම් තැනැත්තකු විසින් සේවානියුක්තිය සැපයීම හෝ භාර ගැනීම වළක්වන,

යම් තැනැත්තකු; හෝ

(ආ) (එහි ප්‍රතිඵලයක් ලෙස නිශ්චිතව දක්වන ලද යම් ක්‍රියාවක් එම වෙනත් තැනැත්තා විසින් සිදු කරනු ලැබුව ද නොලැබුව ද) මේ ඡේදයේ (අ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් භෞතික ක්‍රියාවක් මගින් හෝ යම් භාෂණයක් හෝ ලියවිල්ලක් මගින් වෙනත් යම් තැනැත්තකු පොළඹවන, කැමති කරවා ගන්නා හෝ ධෛර්යය දෙන යම් තැනැත්තකු,

වරදක් සිදු කරන්නේ ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් තමාගේ සේවානියුක්තිය අවසන් කල හෝ ඒ සේවානියුක්තිය අත්හල ලෙස සැලකෙන යම් තැනැත්තකු, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන්, ඔහුට සපයන ලද යම් නිල නිවාසයකින් ඒ සේවානියුක්තිය අවසන් කළ හෝ අත්හල දින සිට දින තුනක් ඇතුළත ඉවත් විය යුතු ය. ඒ කාලසීමාව ඇතුළත එවැනි නිල නිවාසයකින් ඉවත්ව යාම පැහැර හරින යම් තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදක් සිදු කරන්නේ ය.

මේ ඡේදයෙහි "නිල නිවාසය" යන්නෙන්, පදිංචිව සිටින හෝ වාසය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් නවාතැන් පහසුකමක් අදහස් වන අතර ඒ ගොඩනැගිල්ල, කාමරය හෝ වෙනත් නවාතැන් පහසුකම පිහිටා තිබෙන යම් ඉඩම හෝ පරිශ්‍ර ද ඊට ඇතුළත් වේ.

(5) යම් සේවයක්, ජනාධිපතිවරයා විසින් *ගැසට්* පත්‍රයේ පළ කරන නියමයක් මගින් අත්‍යවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක අවශ්‍ය යයි සැළකෙන අවස්ථාවක දී, එසේ අත්‍යාශ්‍යය බවට ප්‍රකාශයට පත් කරන ලද එවැනි යම් සේවයක සේවයේ නියුක්ත කර සිටින හෝ ඒ යම් සේවයකට අයත් යම් නිලධරයකුගේ, සේවකයකුගේ, සේවානියුක්තයකුගේ හෝ අනුයෝජිතයෙකුගේ සේවය, අදාළ විෂයය පවරා දෙනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, ආරක්ෂක විෂයය පවරා දෙනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් අධිග්‍රහණය කරනු ලැබිය හැකි ය.

**13.** (1) ජනාධිපතිවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඉන් කොටසක් සඳහා සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයකු ලෙස ධුරය දැරීම සඳහා යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය. සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා පත් කිරීම

(2) මේ නියෝග යටතේ තමාගේ කාර්යය ඉටු කිරීමේ දී සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයාට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් හෝ නිසි බලධරයන් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝග මගින් හෝ මේ නියෝගය යටතේ සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා වෙත පිරිනමා ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකුට, සහකාර කොමසාරිස්වරයකුට හෝ නිසි බලධරයකුට, සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා විසින් පවරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝග යටතේ වූ කාර්යය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් බලධරයකු හෝ යම් නිලධරයකු වෙත පිරිනමනු ලැබූ යම් බලයක්, සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා විසින් ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය.

(5) සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා විසින් -

(අ) මේ නියෝග යටතේ යම් බලයක් පවරා දී තිබෙන යම් බලධරයකු හෝ නිලධරයකු; හෝ

(ආ) 32 වන නියෝගය යටතේ පත් කරන ලද සම්බන්ධීකරණ නිලධරයකු,

වෙත, සිවිල් ආරක්ෂාව පවත්වාගෙන යන බවට සහතික කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි විධාන දෙනු ලැබිය හැකි අතර, ඒ සෑම විධානයකටම අනුකූලව කටයුතු කිරීම ඒ බලධරයාගේ හෝ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

**14.** සෑම ප්‍රාදේශීය ලේකම්වරයකුට ම, තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා, රජයේ නිලධරයන්ගෙන් සහ ප්‍රජාව අතර පිළිගැනීමක් ඇති වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කරනු ලැබීමට බලය ඇත්තේ ය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මහජන සාමය සුරක්ෂිත කිරීම සහ අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම පිළිබඳව අදාළ බලධාරීන් වෙත උපදෙස් ලබා දීම ඒ සෑම කමිටුවකම කාර්යය විය යුතු ය. උපදේශක කමිටුව

**15.** (1) අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන්ම භාවිතා කරන හෝ ප්‍රයෝජනයට ගනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ පරිශ්‍රයකට අනවසර තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ පූර්වාරක්ෂාවන් යෙදිය යුතු බව නිසි බලධරයකුගේ මතය වන්නේ නම්, ඒ බලධරයා විසින් නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති බලධරයකුගේ හෝ තැනැත්තකුගේ අවසරය නොමැතිව, ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීම් වලට යටත්ව කිසිම තැනැත්තකු ඒ ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ පරිශ්‍රවලට ඇතුළු නොවිය යුතු බවට හෝ එහි රැඳී නොසිටිය යුතු බවට විධාන කළ හැකි ය. අනවසර ඇතුළුවීම වැළැක්වීම

(2) මේ නියෝගය යටතේ කරන ලද නියමයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු ඒ යම් ප්‍රදේශයක, ස්ථානයක හෝ පරිශ්‍රයක සිටියහොත්, ඔහුට විරුද්ධව ගනු ලබන වෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොමැතිව, යම් පොලිස් නිලධරයකු විසින් හෝ නිසි බලධරයකු විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගයෙහි "නිසි බලධරයා" යන්න යම් අත්‍යවශ්‍ය සේවයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සේවයේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් නිසි බලධරයකු ලෙස නමින් හෝ නිලයෙන් පත් කරන ලද යම් තැනැත්තෙක් ඉන් අදහස් වේ.

## III වන කොටස

## වැරදි, දණ්ඩන ආදිය

අත්හැර දමන ලද ගොඩනැගිලි හෝ පරිශ්‍ර ආරක්ෂා කිරීම

**16.** (1) ආපදා කළමනාකරණය, හදිසි අවස්ථා ප්‍රතිචාර හෝ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු යම් රජයේ නියෝජිත ආයතනයක් විසින් නිකුත් කරනු ලබන යම් අනතුරු ඇඟවීමකට, විධානයකට හෝ නියෝගයකට අනුව යම් ගොඩනැගිල්ලක හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය අත්හැර දමා ඇති අවස්ථාවක දී, එම ප්‍රදේශයේ පොලිස් අධිකාරීවරයා විසින්, එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය ආරක්ෂා කිරීම, රැකබලා ගැනීම සහ සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය යම් පියවර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය මගින් පැවරී ඇති බලතලවලට අගතියක් නොමැතිව, එම පියවර සඳහා -

(අ) එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය වෙත අනවසරයෙන් ඇතුල්වීම අවහිර කිරීම හෝ වැළැක්වීම;

(ආ) එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය මුද්‍රා තබා වැසීම, බාධක යොදා අවහිර කිරීම හෝ එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය රැකවල් යටතේ තැබීම; සහ

(ඇ) එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට හානි සිදු විය හැකි, සොරකමට ලක්විය හැකි හෝ නීතිවිරෝධී පදිංචියට ලක්විය හැකි යම් ක්‍රියාවක් ඉවත් කිරීම හෝ වැළැක්වීම,

ඇතුළත් විය හැකි ය.

(3) මේ නියෝගය යටතේ ආරක්ෂා කරනු ලබන හෝ රැකබලා ගනු ලබන යම් ගොඩනැගිල්ලකට හෝ පරිශ්‍රයකට, නීත්‍යානුකූල අධිකාරී බලයක් නොමැතිව කිසිදු තැනැත්තකු විසින් ඇතුල්වීම, පදිංචිවීම, එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට අලාභහානි කිරීම, එම ගොඩනැගිල්ලෙන් හෝ පරිශ්‍රයෙන් දේපළ ඉවත් කිරීම හෝ එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් මැදිහත් වීම නොකළ යුතු වේ.

රජයේ නිලධරයන් අතර අප්‍රසාදය වැළැක්වීම ආදිය

**17.** කිසිම තැනැත්තකු විසින් -

(අ) (i) රජයේ නිලධරයන්;

(ii) ජනරජයේ සේවයෙහි යෙදී සිටින; හෝ

(iii) අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමෙහි යෙදී සිටින,

තැනැත්තන් අතර අප්‍රසාදය ඇති කිරීමට උත්සාහ කිරීම; හෝ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු රජයේ නිලධරයෙකු ලෙස යමක් කිරීමට හෝ යමක් නොකොට පැහැර හැරීමට හෝ පෙළඹවීමට උත්සාහ කිරීම,

නොකළ යුතු ය.

පත්‍රිකා ආදිය බෙදා හැරීම

**18.** මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාමට අගතිදායක වන කාරණා අඩංගු යම් දැන්වීම්, අත්පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනයා අතර බෙදා හැරීම හෝ කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

කටකතා හෝ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම

**19.** මහජනයා බිය ගැන්විය හැකි හෝ මහජනයා කැළඹිය හැකි ආකාරයේ කිසිම කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් කට වචනයෙන් හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ස්වයංක්‍රීය පද්ධති හෝ කෘත්‍රිම

බුද්ධිය ඇතුළු යම් ලිඛිත, ඉලෙක්ට්‍රොනික, ඩිජිටල් හෝ වෙනත් ආකාරයක මාධ්‍යයක් හරහා සන්නිවේදනය කිරීම, පළකිරීම, නිර්මාණය කිරීම හෝ පැතිරවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

**20.** යම් තැනැත්තකු - අසත්‍ය ප්‍රකාශ

(අ) මේ නියෝග හෝ එවැනි නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් යටතේ කරන ලද යම් ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැළකිය යුතු කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට සාධාරණ හේතුවක් තමාට ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එවැනි යම් තොරතුරක් සැපයුවහොත්; හෝ

(ආ) මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ කරනු ලැබූ නියමයක් මගින් ඔහු විසින් කිරීමට නියම කරන ලද යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ වෙනත් ලේඛනයක ඉහත සඳහන් ආකාරයේ ප්‍රකාශයක් කළහොත්,

ඒ තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

**21.** (1) කිසිම තැනැත්තකු, වෙනත් යම් තැනැත්තකු වාසය කරන හෝ වැඩකරන හෝ ව්‍යාපාර කටයුතු ගෙන යන හෝ සිටින යම් නිවසකට හෝ ස්ථානයකට හෝ ඒ නිවසේ හෝ ස්ථානයේ ආසන්නයට එම නිවසේ හෝ ස්ථානයේ සිටින යම් තැනැත්තකු භය ගන්වන ආකාරයෙන් හෝ ඒ නිවසට හෝ ස්ථානයට ඇතුළු වීම හෝ ඉන් පිටවීම අවහිර කරන ආකාරයෙන් හෝ සාමය කඩවීමට හේතුවන ආකාරයෙන් නොයා යුතු ය. බිය ගැන්වීම වැළැක්වීම

(2) මේ නියෝගයෙහි "භය ගැන්වීම" යන යෙදුමෙන්, තැනැත්තකුට, හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට හෝ ඔහුගේ යැපෙන්නන්ට හානියක් සිදුවේ යයි හෝ යම් තැනැත්තකුට හෝ දේපළකට ප්‍රචණ්ඩත්වයක් හෝ අලාභයක් සිදුවේ යයි සාධාරණ සැකයක් යම් තැනැත්තකුගේ සිතේ ඇති කරවීම අදහස් වන අතර, "හානිය" යන යෙදුමට යම් තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තිය, සේවානියුක්තිය හෝ වෙනත් ආදායම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට සිදුවන යම් හානියක් ඇතුළත් වන අතර, නඩු පැවරිය හැකි යම් වරදක් ද ඊට ඇතුළත් වේ.

**22.** කිසිම තැනැත්තකු, මේ නියෝගය මගින් හෝ මේ නියෝග යටතේ වෙනත් යම් තැනැත්තකු පිරිනමන ලද හෝ පනවන ලද යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේ දී හෝ ඉටුකිරීමේ දී ඒ තැනැත්තාට විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතු ය. බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හෝ අවහිර කිරීම

**23.** කිසිම තැනැත්තකු, නීත්‍යානුකූල අවසරයක් නොමැතිව පොදු මාර්ගයකට පාලමකට හෝ බෝක්කුවකට, හෝ යම් දුම්රිය මාර්ගයකට හෝ පොදු මාර්ග ප්‍රවාහන වාහනයකට අවහිර කිරීම හෝ ඒවාට හානි කිරීම නොකළ යුතු ය. පොදු මාර්ග, දුම්රිය මාර්ග ආදියට බාධා කිරීම හෝ හානි කිරීම

**24.** මේ නියෝග යටතේ - වැරදි කිරීමට තැත් කිරීම

(අ) වරදක් කිරීමට තැත් කරන හෝ වරදක් කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් කරන;

(ආ) වෙනත් තැනැත්තකුට වරදක් කිරීමට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ඇ) වරදක් කිරීමට වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, ඒ අනුව ඒ වරද සඳහා නියම කර ඇති ආකාරයට නඩු විභාගයකට ඔහු භාජනය කර මේ නියෝග යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම ඔහුට දඬුවම් කළ යුතු ය.

**25.** මේ නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු වරදකරු බව දනිමින් හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇතිව කිසිම තැනැත්තකු විසින් එකී වරද සඳහා එකී වෙනත් තැනැත්තා වරදකට සහාය වීම

අල්ලා ගැනීම, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත්වීමේ අදහසින් ඒ වෙනත් තැනැත්තාට කිසිම සහායක් නොදිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

**26.** මේ නියෝග යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදුකරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම ; සහ

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම,

එම වරද තමාගේ දැනුම නොමැතිව සිදුකර ඇති බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීමට තමා සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියාකළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැළකිය යුතු ය.

දණ්ඩන

**27.** (1) මේ නියෝග හෝ ඒ යම් නියෝගයක් යටතේ සාදනු ලැබූ යම් නියමයක් හෝ යම් රීතියක්, හෝ ඒ නියෝගයක් යටතේ දෙනු ලැබූ විධානයක් හෝ පනවනු ලැබූ යම් නියමයක්, යම් තැනැත්තකු විසින් උල්ලංඝණය කරනු ලැබුවහොත් හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත්ව, මාස තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) වරදක් සඳහා මේ නියෝග යටතේ දඬුවම් නියම කර නොමැති අවස්ථාවක ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මේ නියෝගයෙහි (1) වන ඡේදයේ නියම කරනු ලැබූ දඬුවමකට ඔහු යටත් විය යුතු ය.

තොරතුරු හෙළිදරව් කිරීමේ කාර්යය

**28.** (1) මේ නියෝග යටතේ වූ වරදක් කිරීමේ චේතනාවක්, ප්‍රයත්නයක් හෝ සූදානමක් ගැන හෝ එවැනි වරදක් සිදුකිරීම පිළිබඳව හෝ දැනගන්නා කවරෙකු වුව ද ඒ පිළිබඳ තොරතුරු ආසන්නතම ග්‍රාම නිලධාරිවරයාට හෝ ආසන්නතම පොලිස් ස්ථානය භාරව සිටින නිලධරයාට වහාම දැන්විය යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් තොරතුරු දැන්වීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු ය.

(3) මේ නියෝග යටතේ වූ වරදක් සම්බන්ධ යම් තොරතුරුක් ලැබුණු යම් ග්‍රාම නිලධාරිවරයකු විසින් ඒ තොරතුරු වහාම ආසන්නතම පොලිස් ස්ථානයට දැන්විය යුතු ය.

අධිකරණයේ නීති කෘත්‍යය සඳහා ප්‍රමුඛත්වය

**29.** මේ නියෝග යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලැබූවේ යයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයක් ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතු ය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ විය යුතු බව

**30.** මේ නියෝග යටතේ සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් විමර්ශනයක්, නඩු පැවරීමක්, නඩු විභාගයක් යනාදිය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

## IV වන කොටස

## විවිධ විධිවිධාන

තොරතුරු ලබා ගැනීම හෝ භාණ්ඩ පරීක්ෂා කිරීමේ බලය

**31.** (1) නිසි බලධාරියා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකුගෙන් ඉල්ලීමක් කළ විටක, ඉල්ලීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි බලධරයකුට හෝ තැනැත්තකුට, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ මේ නියෝගවල කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ සුදුසු යයි බලධරයා හෝ ඉල්ලීම කරන තැනැත්තා

හෝ අදහස් කරන්නා වූ ඉල්ලීමෙහි නිශ්චිතව දක්වා ඇති තොරතුරු හෝ එසේ නිශ්චිතව දක්වා ඇති යම් තැනැත්තකුගේ සන්තකයේ ඇති භාණ්ඩ මේ නියෝගවල අඩංගු විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒ තැනැත්තා විසින් සැපයිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම සන්තකයෙහි ඇති භාණ්ඩයක් සැපයීම හෝ ඉදිරිපත් කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ නියෝගයේ "භාණ්ඩය" යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වෙයි.

සම්බන්ධීකරණ නිලධරයකුගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය

**32.** (1) ජනාධිපතිවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධීකරණ නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කළ හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධීකරණ නිලධරයකු ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් පත් කළ විට ඒ නිලධරයා විසින් ලිඛිත නීතියක් යටතේ හෝ අන් ආකාරයකින් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත පිරිනමන ලද හෝ පනවන ලද සියලු බලතල, කාර්යය හෝ කර්තව්‍ය ඒ ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය. තව ද ඒ කාර්යය සඳහා ඒ ලිඛිත නීතියෙහි දිස්ත්‍රික් ලේකම් ගැන වූ සෑම සඳහන් කිරීමක් ම, ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධීකරණ නිලධරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින්, නියමයේ සඳහන් යම් ප්‍රදේශ කිසිවක් සඳහා (1) වන ඡේදය යටතේ පත් කරන ලද සම්බන්ධීකරණ නිලධරයන් විෂයයෙහි අධීක්ෂණ කටයුතු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ සිය බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයාට සහය වීම පිණිස අවශ්‍ය, යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයන් නමින් හෝ නිලයෙන් ජනාධිපතිවරයා විසින් පත් කළ හැකි ය.

(5) මේ නියෝග යටතේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයා වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයා විසින් (4) වන ඡේදය යටතේ පත් කරන ලද යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(6) (3) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු විසින්, හෝ (4) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු විසින් හෝ (5) වන ඡේදය යටතේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයාගේ බලතල පවරනු ලැබුවා වූ, යම් නිලධරයකු විසින් -

(අ) තමා අධීක්ෂණ කටයුතු කරන්නේ නම් සම්බන්ධීකරණ නිලධරයකු විෂයයෙහි ද, ඒ සම්බන්ධීකරණ නිලධරයා වෙත පිරිනමන ලද හෝ පනවන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) තම අධීක්ෂණ යටතේ සිටින යම් සම්බන්ධීකරණ නිලධරයකු විෂයයෙහිලා, ඒ සම්බන්ධීකරණ නිලධරයා වෙත මේ නියෝග මගින් පිරිනමන ලද හෝ පනවන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම පිළිබඳව, විශේෂ හෝ සාමාන්‍ය විධාන කරනු ලැබිය හැකි ය.

වගකීමෙන් ආරක්ෂා කිරීම

**33.** මේ නියෝග හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක හෝ කරන ලද විධානයක විධිවිධාන යටතේ යම් කාර්යයක් කිරීම සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් කිසිම අධිකරණයක නොපැවරිය යුතු ය.

ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

**34.** 2025 නොවැම්බර් මස 28 වන දින අංක 2464/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2025 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග, ඒ යටතේ කලින් නිසි ලෙස කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබේ.

EOG 01-0284

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.